සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

9 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය** කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 හා 02 ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

01 සම්මත සිංහල අක්ෂර මාලාවේ ස්වර අක්ෂර සංඛ්‍යාව

(i) 60 කි. (ii) 42 කි. (iii) 18 කි. (iv) 25 කි.

02 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදයක් නොවන්නේ,

(i) විස්මය (ii) විශිෂ්ඨ (iii) ශ්‍රේෂ්ඨ (iv) ප්‍රස්තාර

- **අංක 03 සිට 06 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පද කුමන වියරණ වර්ගයට අයත්වේදැයි තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

03 <u>සමහරෙක්</u> උනන්දුවෙන් වැඩ කරති.

(i) කර්ම පදයකි. (ii) ආඛ්‍යාත පදයකි.
(iii) විශේෂණ පදයකි. (iv) නිත්‍ය බහුවචන පදයකි.

04 ගොපල්ලා <u>ගවයන්</u> ගාලට දක්කයි.

(i) උක්ත පදයකි. (ii) අනුක්ත පදයකි.
(iii) ආඛ්‍යාත පදයකි. (iv) විශේෂණ පදයකි.

05 ඔහු <u>හොඳින්</u> ඉගනීම් කටයුතුවල නිරත වෙයි.

(i) කර්ම පදයකි. (ii) උපසර්ග පදයකි.
(iii) විශේෂණ පදයකි. (iv) නාම පදයකි.

06 <u>මම</u> පොතක් කියවමි.

(i) ප්‍රථම පුරුෂ ඒක වචන නාම පදයකි. (ii) මධ්‍යමපුරුෂ ඒක වචන නාම පදයකි.
(iii) උත්තම පුරුෂ ඒකවචන සර්වනාම පදයකි. (iv) උත්තම පුරුෂ බහු වචන නාම පදයකි.

07 පහත දී ඇති උක්ත පදවලට ගැළපෙන අනුක්ත පදය තිත් ඉර මත ලියන්න.

(i) දූරියක් ..........................................
(ii) රීතියක් ..........................................

08 ''ආදායම පහත වැටීම'' යන අදහස පළකරන රූඪී පදය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(i) බහින කලාව (ii) උපාසක බළලා (iii) සායම යනවා (iv) කොරේ පිටට මරේ

09 ''දේශාභිමානී'' යන වචනය යොදා අර්ථවත් වාක්‍යයක් නිර්මාණය කරන්න.

..........................................................................................

10 පහත දී ඇති වාක්‍යය නිවැරදි කර තිත් ඉර මත නැවත ලියන්න.

(i) පියාණෝ උදෑසනම රැකියාවට පිටත් විය.

..................................................................................................................

(ii) පන්තියේ එක් අයෙක් නැටුම් තරගයට ඉදිරිපත් වෙති.

..................................................................................................................

11 පහත දී ඇති පදවලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(i) අනුන් විසින් පෝෂණය කළ ..................................................

(ii) කිසිම ප්‍රයෝජනයකට නැති ..................................................

12 පහත සඳහන් පදවලට සමානාර්ථ පද දෙක බැගින් ලියන්න.

(i) මුහුද ......................................... .........................................

(ii) සතුට ......................................... .........................................

13 පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(i) ශබ්ද .........................................

(ii) ජන .........................................

14 පහත දැක්වෙන පුරුෂලිංග නාම පදයට අයත් ස්ත්‍රී ලිංග නාම පදය ලියන්න.

(i) සර්පයා .........................................

(ii) අශ්වයා .........................................

15 පූර්ව ක්‍රියාපද දෙකක් එකතුවීමෙන් සෑදුනු යුගල පදයක් වන්නේ,

(i) නඩුහබ (ii) දිවිලි පැනිලි (iii) ගසා බසා (iv) කවා පොවා

16 පහත සඳහන් ග්‍රාම නාමයන් අකාරාදි පිළිවෙළට සකස් කර නැවත ලියන්න.

මහනුවර, කුරුණෑගල, ගම්පොල, කෝට්ටේ

..................................................................................................................

17 පහත සඳහන් බහු අර්ථ පදවලට අයත් අර්ථ දෙකක් තිත් ඉර මත ලියන්න.

(i) කර ......................................... .........................................

(ii) වත ......................................... .........................................

18 පහත සඳහන් පදවල නිවැරදි අර්ථය තිත් ඉර මත ලියන්න.

(i) බිතක්කන .........................................

(ii) අසනිපාතයක් .........................................

- **අංක 19 හා 20 ප්‍රශ්නවල එන කවිවල ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.**

19 .........................................

.........................................

හොඳ ළමයා නුවණි නී

හොඳ දේ තෝරා ග නී

20 කරුණා මහිම කොයිතරම් ද කිවොත් ඔබේ

මැවුණා මහා ගංගාවල් ලෙසිස් ඉබේ

.........................................

.........................................

(ල. 2 × 20 = 40)

## II කොටස

- **01, 02, 03, 04 යන ප්‍රශ්නවලට හා 05, 06 යන ප්‍රශ්න දෙකෙන් එකකටත් පිළිතුරු සපයන්න.**

01 පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) මුණිදාස කුමාරතුංග මහතා විසින් රචිත ළමා ගද්‍ය සාහිත්‍යය කෘතියක් හා ළමා පද්‍ය නිර්මාණයක් නම් කරන්න.

(ii) ලංකාවේ කලාව ඇතුළු සංස්කෘතිකාංග අළලා ලියූ මධ්‍යකාලීන සිංහල කලා කෘතියේ රචකයාගේ නම ලියන්න.

(iii) පහත සඳහන් ධීවර භාෂාවේ එන වචනවල අර්ථය ලියන්න.

1. අම්බාවෝ 2. කෝඩය

(iv) ''ඔබ වෙනුවෙන් ඉදෙන බතේ - සිනා හඬට කන්දී ගෙන ......'' යන පද්‍ය නිර්මාණය රචනා කළ රචකයාගේ නම ලියන්න.

(v) ''මල් මල් වාරම් හරිමැ උදාරම්.....'' ගීතය රචනා කළ රචකයාගේ නම ලියන්න.

(vi) පෙබරවාරි 24 ජාතික නර්තන දිනය ලෙස නම් කරන ලද්දේ කවරෙකුට උපහාර පිණිස ද?

(vii) දඹදෙණි යුගයේ රචිත සද්ධර්ම රත්නාවලිය ග්‍රන්ථය ලියූ ලේඛකයාගේ නම ලියන්න.

(viii) ස්වාභාවෝක්තිය යනු කුමක් ද?

(ix) ව්‍යාපාරික ලිපියක ආකෘතිය තුළ දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

(x) ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමියන් ලියූ ළමා පද්‍ය සංග්‍රහයක් නම් කරන්න. (ලකුණු $1 \times 10 = 10$)

02 පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 200 කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.

(i) සාහිත්‍යය පොතපත පරිශීලනයෙන් ලැබිය හැකි ප්‍රයෝජන

(ii) කැලි කසළ නිසිලෙස බැහැර කිරීම සැමට සෙතකි.

(iii) තාක්ෂණික මෙවලම් භාවිතයෙන් අධ්‍යාපනයේ නිසි ඵල ලබමු.

(iv) ආනන්ද කුමාරස්වාමි මහතා

(v) පරිසරය අප රකී, රකිමු අපි පරිසරය (ලකුණු 20)

03 පෙළ පොතේ ඇතුළත් පාඩම් ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ''පෙර සුවසේ කැම්හ. පූම්හ.''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(ආ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කාහට කියන ලද්දේ ද?

(ii) ''පුත, ඔබ බෝසත්වරයෙකි''

(අ) මෙම ප්‍රකාශය කළේ කවුද? කාහට ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(iii) ''දැන් අපි එතුමාගේ නිර්මාණ කීපයක් රස විඳිමු''

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(ආ) මෙම ප්‍රකාශය කළේ කවුද? කාහට ද?

(iv) ''ලක්මිණි පහන මගින් ඔහු වර්තමාන පුවත්පත් කලාවට පුළුල් බලපෑමක් ඇති කළේය.''

(අ) මෙහි සඳහන් ඔහු යනුවෙන් හඳුන්වන පුද්ගලයාගේ නම කුමක් ද?

(ආ) හෙළ බසේ ස්වීයත්වය සුරැකීම උදෙසා මෙතුමා ප්‍රකාශවට පත් කළ සගරාව කුමක් ද?

(v) ''පෙම්මා සුරතල් කියමින් දෙතනේ කිරි බොම්මා
වම්මා කඳුළැලි ඉස ඉස ඇවිදින් දූයි අම්මා
අම්මා අප නොදැක ඉතින් කෙළෙසක වැවෙම්මා
සම්මා සම්බුදු වන ද නිවන් දකින් අම්මා''

(අ) මෙම පද්‍ය පංතිය ඇතුළත් මුල් ග්‍රන්ථය කුමක් ද?

(ආ) ඉහත පද්‍යයේ ප්‍රාර්ථනාවක් පළකරන පද්‍ය පාදය උපුටා දක්වන්න. (ලකුණු 2 x 5 = 10)

04 සිසුන් තුළ අමතර පොත පත කියවීමේ පුරුද්ද වර්ධනය කිරිමේ අරමුණින් මෙවර සාහිත්‍යය මාසයට සමගාමීව පොත් ප්‍රදර්ශනයක් හා පොත් සල්පිළක් සංවිධානය කිරීමට පාසලේ සාහිත්‍යය සමිතියේදී යෝජනා විය. මේ පිළිබඳව අවධානය යොමුකළ විදුහල්පති තුමා කුරුණෑගල, මීගමු පාරේ, අංක 20 දරණ ස්ථානයේ පිහිටි දැනුම පොත් ප්‍රකාශන සමාගමේ අනුග්‍රහය ලබාගැනීම සඳහා එහි කළමනාකාර තුමා වෙත යවන ව්‍යාපාරික ලිපිය සකස් කරන්න. (ලකුණු 10)

05 පහත දී ඇති කර්තෘකාරක වාක්‍යය කර්මකාරකයට හරවා ලියන්න.

(i) ශිෂ්‍ය නායිකාවක් උදෑසන රැස්වීම මෙහෙයවයි.

(ii) හමුදා භටයෙක් ත්‍රස්තවාදියකු පසුපස ලුහුබඳියි.

(iii) ඔවුහු අප සුහදව පිළිගත්හ.

(iv) නංගී මල් කඩයි.

(v) වියත්හු ශාස්ත්‍රීය ග්‍රන්ථ ලියූහ. (ලකුණු 2 x 5 = 10)

06 පහත සඳහන් වාක්‍යය නිදොස්කොට ලියන්න.

(i) මව්පියෝ විසින් දරුවන් ආරක්ෂා කෙරෙති.

(ii) මැණියෝ දරුවෝ පෝෂණය කරයි.

(iii) ළමා පෙළ පන්තිකාමරයට පිවිසෙයි.

(iv) ගුරුවරුන් අපිට අවවාද දෙයි.

(v) වෘක්ෂයන් මහ සුළඟින් ඉදිරි වැටෙයි. (ලකුණු 2 x 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) 3 (02) 2 (03) 4 (04) 3 (05) 3 (06) 3 (07) දූරියක / රීතියක්

(08) 1 (09) අර්ථය ප්‍රකාශවන නිවැරදි වාක්‍ය සඳහා ලකුණු ලබාදෙන්න.

(10) (i) පිටත්වෙති (ii) ඉදිරිපත්වෙයි.

(11) (i) පරපුටු (ii) නිෂ්ප්‍රයෝජන

(12) (i) සමුදුර, සයුර, සමුද්‍රය, සිඳු (ii) සතොස, සොම්නස, ප්‍රබෝදය, තුඩ

(13) (i) නිශ්ශබ්ද (ii) දුර්ජන

(14) (i) සැපින්න (ii) වෙළඹ

(15) කවා පොවා

(16) කුරුණෑගල, කෝට්ටේ, ගම්පොල, මහනුවර

(17) (i) අත, බෙල්ල, කරන්න (ii) මුහුණ, වස්තුව, වස්ත්‍රාය, කතාව

(18) (i) පිළිකන්න, අගුව (ii) හෙනගැසීම

(19) මල්වල සුමිහිරි පැණි
ඇද බොන බඹරා මෙණි

(20) ඉනුණා බසින දියරක් තැවරුණොත් ඔබේ
මරණාසන්න හුස්මට මුත් ආසි ලැබේ (ලකුණු 2 x 20 = 40)

## II කොටස

(01) (i) හීන්සැරය / මගුල්කෑම / හත්පන / හාවාගේ වත / නැළවිල්ල / සිරිමත් / වෙළෙන්දි
(ii) ආනන්ද කුමාරස්වාමි මහතා
(iii) දූල් අදින්නෝ / වැස්ස
(iv) දයාසේන ගුණසිංහ මහතා
(v) කැලිස්ටස් ජයසිංහ මහතා
(vi) පණිහාරතයන්ට උපකාර පිණිස
(vii) ධර්මසේන හිමියන්
(viii) යමක් ඇති සැටියෙන් දක්වීම
(vi) යවන්නාගේ ලිපිනය / ලබන්නාගේ ලිපිනය / මාතෘකාව
(x) කව්මිණ, කව්මුතු, ළමා කවි කළඹ, ඔවාමුතුදම, දරුනැලවිල්ල (ලකුණු 1 x 10 = 10)

(02) සාරවත් බව (ලකුණු 08)
නිර්මාණාත්මක බව(ලකුණු 07)
ශිල්පීය දක්ෂතා (අත් අකුරු, ඡේද බෙදීම, නිවැරදි වියරණ, අක්ෂර වින්‍යාසය) (ලකුණු 05)
(මුළු ලකුණු 20 යි.)

(03) (i) (අ) මහා ධන සිටු පුත්හුගේ වස්තුව (ආ) බුදුන් වහන්සේ විසින් භික්ෂූන්ට
(ii) (අ) ශ්‍රී පාදය වැන්ද වූ හැටි (ආ) සිටු මැණියෝ - බාල පුතාට
(iii) (අ) දේශීය නර්තනයේ රන් සලකුණ (ආ) කථකයා විසින් ප්‍රේක්ෂකයන්ට
(iv) (අ) කුමාරතුංග මුණිදාස මහතා (ආ) සුබස සගරාව
(v) (අ) වෙස්සන්තර ජාතක කාව්‍යය (ආ) සම්මා සම්බුදු වනදා නිවන් දකින් අම්මා
(ලකුණු 2 x 5 = 10)

(04) ආකෘතිය (ලකුණු 04)
අන්තර්ගතය (ලකුණු 04)
ශිල්පීය දක්ෂතා (ලකුණු 02) (මුළු ලකුණු 10 යි.)

(05) (i) ශිෂ්‍ය නායිකාවක විසින් උදෑසන රැස්වීම මෙහෙයවනු ලබයි / මෙහෙයවේ.
(ii) හමුද භටයෙකු විසින් ත්‍රස්තවාදියෙක් පසුපස ලුහුබඳිනු ලබයි / ලුහුබඳිනු ලැබේ.
(iii) ඔවුන් විසින් අපි සුහදව පිළිගනු ලැබීමු.
(iv) නංගි විසින් මල් කඩනු ලබයි / ලැබේ.
(v) වියතුන් විසින් ශාස්ත්‍රිය ග්‍රන්ථ ලියනු ලැබීය. (ලකුණු 2 x 5 = 10)

(06) (i) මව්පියන් විසින් දරුවෝ ආරක්ෂා කරනු ලැබෙති.
(ii) මැණියෝ දරුවන් පෝෂණය කරති.
(iii) ළමා පෙළ පන්ති කාමරයට පිවිසෙති.
(iv) ගුරුවරු අපට අවවාද දෙති.
(v) වෘක්ෂයෝ මහ සුළඟින් ඉදිරී වැටෙති. (උක්ත ආඛ්‍යාතය ගලපා නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.) (ලකුණු 2 x 5 = 10)